# සමාජ සංවර්ධන සහකාර (මධ්‍යම රජය)

## සුමුදු ලියනගේ මහතා

**1.අධ්‍යාපනය ලබන ආබාධ සහිත දරුවන් සඳහා අධ්‍යාපන ආධාර (පාසල් උපකරණ) ලබා දිම.**

- ❖ අඩු ආදායම්ලාභි පවුලක ආබාධ සහිත දරුවකු හෝ භාරකරු ආබාධ සහිත විම අයඳුම්පත් දොම්පෙ ප්‍රාදේශිය ලේකම් කාර්යාලයේ සමාජ සංවර්ධන සහකාර නිලධාරියාගෙන් ලබා ගෙන ග්‍රාම නිලධාරි නිර්දේශය, විදුහල්පති නිර්දේශය සහිතව භාර දිය යුතුය

**2. ආබාධ සහිත දරුවන් සඳහා වෛද්‍යාධාර ලබා දිම.**

- ❖ වෛද්‍ය නිර්දේශය මත ඖෂධ සඳහා ආධාර ලබා දිම.
- ❖ දරුවා සායන සඳහා රැගෙන යාමට ඒමට ගමන් වියදම් ලබා දිම. (අයඳුම්පත් දොම්පෙ ප්‍රාදේශිය ලේකම් කාර්යාලයේ සමාජ සංවර්ධන සහකාර නිලධාරියාගෙන් ලබා ගෙන ග්‍රාම නිලධාරි නිර්දේශය, වෛද්‍ය නිර්දේශය සමඟ ඉදිරිපත් කළ යුතුය).

**3. ආබාධ සහිත දරුවන් සඳහා ජීවනාධාර ලබා දිම.**

- ❖ අයඳුම්පත් දොම්පෙ ප්‍රාදේශිය ලේකම් කාර්යාලයේ සමාජ සංවර්ධන සහකාර නිලධාරියාගෙන් ලබා ගෙන ග්‍රාම නිලධාරි නිර්දේශය,ආබාධ සහිත බව සනාථ කෙරෙන වෛද්‍ය නිර්දේශය සමඟ ඉදිරිපත් කළ යුතුය.

**4. පාසල් යන දරුවන් සිටින (අවු.50ටඅඩු )තනි මා පිය පවුල් ඒකක සඳහා ස්වයං රැකියා ආධාර ලබා දිම.**

- ❖ අයඳුම්පත් දොම්පෙ ප්‍රාදේශිය ලේකම් කාර්යාලයේ සමාජ සංවර්ධන සහකාර නිලධාරියාගෙන් ලබා ගෙන ග්‍රාම නිලධාරි නිර්දේශය සහිතව උප්පැන්න, විවාහ,මරණ, දික්කසාද සහතික ඉදිරිපත් කළ යුතුය.

**5. ආබාධ සහිත දරුවන් සිටින දෙමව්පියන්ට ස්වයං රැකියා ආධාර ලබා දිම.**

- ❖ අයඳුම්පත් දොම්පෙ ප්‍රාදේශිය ලේකම් කාර්යාලයේ සමාජ සංවර්ධන සහකාර නිලධාරියාගෙන් ලබා ගෙන ග්‍රාම නිලධාරි නිර්දේශය, වෛද්‍ය නිර්දේශය සහ ව්‍යාපෘති වාර්කාව සමඟ ඉදිරිපත් කළ යුතුය.

**6. ආබාධ සහිත දරුවකු සිටින පවුලකට නිවසක් නොමැති නම් නිවාස ආධාර ලබා දිම.**

- ❖ දරුවා නමට ඉඩමේ අයිතිය තිබිය යුතුය. නැතහොත් ගිවිසුමක් මඟින් ඉඩම පැවරිය හැකිය.

**7. සුසුම්නා අබාධ වූ දරුවන් සඳහා සනීපාරක්ෂක පහසුකම් ලබා දිම.**

- ❖ අයඳුම්පත් දොම්පෙ ප්‍රාදේශිය ලේකම් කාර්යාලයේ සමාජ සංවර්ධන සහකාර නිලධාරියාගෙන් ලබා ගෙන ග්‍රාම නිලධාරි නිර්දේශය, , වෛද්‍ය වාර්තාව හා ඇස්තමේන්තුව සමඟ ඉදිරිපත් කළ යුතුය.

<u>සමාජ සේවා නිලධාරි (පළාත් සභා)</u>

<u>ගාමිණී වීරකෝන් මහතා.</u>

**1.තනි මා පිය ආධාර වැඩසටහන**

- ❖ පියා නොමැති අඩු ආදායම්ලාභි පවුලක දරුවන් පාසල් ගත කිරිම සඳහා ලබා දිම. ( ග්‍රාම නිලධාරි මඟින් හෝ දොම්පෙ ප්‍රාදේශිය ලේකම් කාර්යාලයේ සමාජ සේවා නිලධාරියාගෙන් අයදුම් පත්‍රය ලබා ගෙන , ග්‍රාම නිලධාරි නිර්දේශය, විදුහල්පති නිර්දේශය සහිතව නැවත දොම්පෙ ප්‍රාදේශිය ලේකම් කාර්යාලයේ සමාජ සේවා නිලධාරියා වෙත භාර දිය යුතුය.)

**2. ආබාධ සහිත දරුවන් සඳහා ආබාධිත උපකරණ ලබා දිම.(ඇස් කණ්ණාඩි, සුදු සැරයටි,රෝද පුටු, ශ්‍රවණ උපකරණ , කිහිලි කරු,අත් වාරු, කෘත්‍රිම අත්, පා ලබා දිම)**

- ❖ අඩු ආදායම්ලාභි පවුලක් විය යුතුය , ග්‍රාම නිලධාරි මඟින් හෝ දොම්පෙ ප්‍රාදේශිය ලේකම් කාර්යාලයේ සමාජ සේවා නිලධාරියාගෙන් අයදුම් පත්‍රය ලබා ගෙන , ග්‍රාම නිලධාරි නිර්දේශය, සහිතව නැවත ග්‍රාම නිලධාරි වෙත භාර දිය යුතුය.

**3.මහජනාධාර ලබාදීම.**

- ❖ ඉතා දිලිඳු පවුල් සඳහා, ග්‍රාම නිලධාරි මඟින් හෝ දොම්පෙ ප්‍රාදේශිය ලේකම් කාර්යාලයේ සමාජ සේවා නිලධාරියාගෙන් අයදුම් පත්‍රය ලබා ගෙන , ග්‍රාම නිලධාරි නිර්දේශය, සහිතව නැවත දොම්පෙ ප්‍රාදේශිය ලේකම් කාර්යාලයේ සමාජ සේවා නිලධාරි වෙත භාර දිය යුතුය.

**4 ආබාධිත පාසැල් දරුවන් සඳහා කොමඩ් වැසිකිලි සැපයීම.**

- ❖ ග්‍රාම නිලධාරි මඟින් හෝ දොම්පෙ ප්‍රාදේශිය ලේකම් කාර්යාලයේ සමාජ සේවා නිලධාරියාගෙන් අයදුම් පත්‍රය ලබා ගෙන , ග්‍රාම නිලධාරි නිර්දේශය, සහිතව නැවත දොම්පෙ ප්‍රාදේශිය ලේකම් කාර්යාලයේ සමාජ සේවා නිලධාරියා වෙත භාර දිය යුතුය.

**5.පිළිකා ආධාර , ලාදුරු ආධාර, තැලසිමියා සහ ක්ෂය රෝග ආධාර ලබා දිම.**

- ❖ අඩු ආදායම්ලාභී පවුල් සඳහා, ග්‍රාම නිලධාරි මඟින් හෝ දොම්පෙ ප්‍රාදේශිය ලේකම් කාර්යාලයේ සමාජ සේවා නිලධාරියාගෙන් අයදුම් පත්‍රය ලබා ගෙන රජයේ රෝහලක විශේෂඥ වෛද්‍යවරයක්ගෙන් ලබා ගත් විධිමත් වෛද්‍ය සහතිකය සමඟ ග්‍රාම නිලධාරි නිර්දේශය, සහිතව නැවත දොම්පෙ ප්‍රාදේශිය ලේකම් කාර්යාලයේ සමාජ සේවා නිලධාරි වෙත භාර දිය යුතුය. (පිළිකා ආධාර ගෙවනුයේ මහරගම පිළිකා රෝහලකින් ලබා ගත් වෛද්‍ය වාර්තාවට පමණි.)

## ළමා හිමිකම් ප්‍රවර්ධන නිලධාරි / සහකාර (මධ්‍යම රජය)

## කේ.සි.ඉලංගනි මහත්මිය / නිරෝෂා බණ්ඩාර මහත්මිය

**1.ආධාර වැඩසටහන් ක්‍රියාත්මක කිරිම. (අධ්‍යාපනාධාර, වෛද්‍යාධාර,නිවුන්දරු ආධාර,පෝෂණාධාර)**

- ❖ අඩු ආදායම්ලාභි පවුලක් විය යුතුය , ඉල්ලීම් ලිපිය , ග්‍රාම නිලධාරි නිර්දේශය , දරුවන්ගේ උප්පැන්න සහතික පිටපත්,පාසලේ ඉගෙනුම ලබන බවට විදුහල්පති නිර්දේශය, සමඟ දොම්පෙ ප්‍රාදේශිය ලේකම් කාර්යාලයේ ළමා හිමිකම් ප්රවර්ධන නිලධාරියා හමු විය යුතුය.

**2. පැමිණිලි විමර්ෂන**

- ❖ අවදානම් සහගත පවුල් හා අවු:18ට අඩු දරුවන් සම්බන්දයෙන් ලැබෙන පැමිණිලි විමර්ශනය කොට සුදුසු සේවා සැපයිම(වාචිකව හා ලිඛිතව) .

**3.දැනුවත් කිරිම**

- ❖ ළමා අපයෝජනය , ළමා අපචාර , ළමා අයිතිවාසිකම් සම්බන්දයෙන් දරුවන්,දෙමාපියන්,රාජ්‍ය / රාජ්‍ය නොවන අංශවල නිලධාරින් දැනුවත් කිරිමේ වැඩමුළු පැවැත්විම .

**4. පාසල් නොයන දරුවන් පාසල් ගත කිරිම.**

- ❖ කඩින් කඩ පාසල් යන , පාසල් නොයන දරුවන් පාසල් ගත කිරිම

## ළමා ආරක්ෂක නිලධාරි - (ජාතික ළමා ආරක්ෂක අධිකාරියට අනුයුක්තව)

## දේවිකා අත්තනගොඩ මෙනවිය

**1.1929 පැමිණිලි පරීක්ෂාව**

- ❖ ජාතික ළමා ආරක්ෂක අධිකාරියට අයත් ළමා උපකාරක දුරකථන සේවාවට (1929) ලැබෙන පැමිණිලි පරීක්ෂාව,යොමු කිරිම්,මැදිහත්විම,උපදෙස් ලබා දිම.

**2.පාසල් ළමාරක්ෂක කමිටු පිහිටුවිම (6 – 13 ශ්‍රේණි සඳහා)**

- ❖ ළමුන් ළමා අපයෝජනයන්ගෙන් ආරක්ෂා විම හා වැලැක්විම සම්බන්දයෙන් දැනුවත් කිරිම
- ❖ ගැටළු සහිත දරුවන් සඳහා මැදිහත්විම හා වෙනත් ආයතන සඳහා යොමු කිරිම.

**3. ළමා අපයෝජනය වැළැක්විම පිලිබඳ දැනුවත් කිරිමේ වැඩසටහන් පැවැත්විම.**

**4. ළමා ආරක්ෂක ගම්මාන වැඩසටහන (Angle network )**

**5.ළමා නිවාස අධීක්ෂණ කටයුතු සඳහා සහාය දැක්විම.**

## නිපුණතා සංවර්ධන නිලධාරි - (නිපුණතා සංවර්ධන හා වෘත්තීය පුහුණු අමාත්‍යාංශයට අනුයුක්තව)

## ආර්.එම්.එම්.සි.රත්නායක මහතා

**1.**දරුවන් සඳහා වෘත්තිය පුහුණුව සඳහා යොමු කිරිම.

- ❖ අවු 16 ට වඩා වැඩි දරුවන්ට ස්ව කැමැත්ත අනුව වෘත්තිය මාර්ගෝපදේශනවැඩසටහන් පවැත්විම, පුහුණුව සඳහා බඳවා ගැනිම හා යොමු කිරිම ,ප්‍රායෝගික පුහුණුව, රැකියා ගත කිරිම
  (අදාල අයදුම්පත දොම්පේ ප්‍රාදේශිය ලේකම් කාර්යාලයේ නිපුණතා සංවර්ධන නිලධාරි )

**2.**සිද්ධාන්ත දැනුම ලබා ගත් ළමුන් ප්‍රායෝගික පුහුණුව සඳහා කාර්මික විද්‍යාලය, යොවුන් සේනාංකය,වෘත්තිය පුහුණු අධිකාරිය, ජාතික ආධුනිකත්ව මණ්ඩලය(NAITA ),ඉංජිනේරු තාක්ෂණ ආයතනය, හාඩි ආයතනය, ජර්මානු කාර්මික අභ්‍යාස ආයතනය,ජපන් කාර්මික අභ්‍යාස ආයතනය,ලුහු ඉංජිනේරු පුහුණු මධ්‍යස්ථාන, තරුණ සේවා සභාව යටතේ ඇති පුහුණු මධ්‍යස්ථාන, සාගර විශ්ව විද්‍යාලය යනා දි ආයතන වෙත යොමු කිරිම.

**3.** පාඨමාලාව හැදැරුවන් සඳහා නිපුණතා ණය යෝජනා ක්‍රම ක්‍රියාත්මක කිරිම.

**4.**රැකියා අපේක්ෂිතයින් සඳහා ස්වයං රැකියා පුහුණුව ලබා දිම හා රැකියා ගත කිරිම.

## මානව සම්පත් සංවර්ධන නිලධාරි - (මිනිස්බල හා රැකී රක්ෂා දෙපාර්තමේන්තුවට අනුයුක්තව)

## කමල් විතානාරච්චි මහතා

**1.**පාසල් දරුවන් සඳහා වෘත්තීය මාර්ගෝපදේශන වැඩමුළු පැවැත්වීම .

- ❖ අවු 16 ට ඉහල දරුවන් සඳහා වෘත්තීය මාර්ගෝපදේශනය පිලිබඳ දැනුවත් කිරිම.

**2.** පාසල් දරුවන් සඳහා වෘත්තීය ප්‍රවේශ මාර්ග හඳුන්වා දිම.

**3.**ළමා නිවාස හා ආබාධිත දරුවන් සඳහා රැකියා වැඩසටහන් හඳුන්වා දිම හා යොමු කිරිම.

## ස්ථානභාර පරිවාස නිලධාරි - (පරිවාස කාර්යාලය - පූගොඩ)

## එන්.අයි.දිපිකා ගුණවර්ධන මහත්මිය

**1.**ළමා නිවාස හා ළදරු උයන් අධීක්ෂණය කිරිම,නඩත්තුව සඳහා යථායෝග්‍යාධාර සැපයිම.

**2.**වෙනත් ඉල්ලිම් යටතේ ළමා නිවාස ගත කිරිම්, කුලවද්දා ගැනිම්(දරුකමට හදා වඩා ගැනිම),විමර්ෂණ හා වාර්තා සැපයිම.

**3. " සිසු මිණ ශිෂ්‍යත්ව " ආධාර වැඩසටහන.**

**4.දැනුවත් කිරිමේ වැඩසටහන් පැවැත්විම.**

**<u>ප්‍රජා පොලිස් ඒකකය හා ළමා හා කාන්තා කාර්යාංශ ස්ථානාධිපති , කාන්තා පොලිස් පරීක්ෂක - (ප්‍රජා පොලිස් ඒකකය හා ළමා හා කාන්තා කාර්යාංශය)</u>**

**1.පාසල් නොයන දරුවන් පාසල් ගත කිරිම**

**2.අනාරක්ෂිතව සිටින දරුවන් සම්බන්දයෙන් නිසි ක්‍රියා මාර්ග ගැනිම.**

**3.දෙමව්පියන්ට අකීකරු දරුවන් සම්බන්දව මැදිහත්විම**

**4.ප්‍රජා පොලිස් කමිටු හරහා ළමා අපයෝජන ,ළමා අපචාර පිලිබඳ පාසල් ප්‍රජා දැනුවත් කිරිම.**

**<u>ව්‍යාපෘති නිලධාරි (නොවිධිමත්)- (කලාප අධ්‍යාපන කාර්යාලය - ගම්පහ)</u>**

**<u>එල්.ඒ.ඩී.ඒ.සුසිලා සමරසිංහ මහත්මිය</u>**

1.අනිවාර්යය අධ්‍යාපන නියෝග ක්‍රියාත්මක කිරිම.

2.පාසල් හැර ගිය අය සඳහා වෘත්තිය පුහුණු කුසලතා වැඩමුළු පැවැත්විම.

3.පාසල් දරුවන් සඳහා පෞරුෂ හා ආකල්ප සංවර්ධන වැඩසටහන් පැවැත්විම.

4.පසුබට දරුවන්ගේ දෙමව්පියන් සඳහා පෞරුෂ හා ආකල්ප සංවර්ධන වැඩසටහන් පැවැත්විම.

**<u>මුල් ළමා විය සංවර්ධන නිලධාරි - (ළමා ලේකම් කාර්යාලයට අනුයුක්තව)</u>**

**<u>සෙව්වන්දි රණතුංග මහත්මිය</u>**

**1.පෙර පාසල් ලියාපදිංචිය සඳහා මහ පෙන්විම**

- බස්නාහිර පළාත් ප්‍රඥප්ති කාර්යාලයට යොමු කිරිම.

**2.පෙර පාසල් , දිවා සුරැකුම් මධ්‍යස්ථානඅධීක්ෂණය**

- ළමා ලේකම් කාර්යාලය මඟින් නිර්දේශිත ප්‍රමිති සඳහා මහ පෙන්විම

**3.පෝෂණ මුද්දර (ගැබිණි මවට උත්තම පූජා වැඩසටහන) ක්‍රියාත්මක කිරිම.**

අයදුම් පත්‍රය පවුල් සෞඛ්‍ය සේවා නිලධාරිගෙන් ලබා ගෙන සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි නිර්දේශය, ස්ථිර පදිංචි වසමේ ග්‍රාම නිලධාරි නිර්දේශය, රැගෙන පැමිණි විට දොම්පේ ප්‍රාදේශිය ලේකම් කාර්යාලයේ මුල් ළමා විය සංවර්ධන නිලධාරිගෙන් පෝෂණ මුද්දරය මව වෙත නිකුත් කිරිම.

**4.''අරුණ දකින රටා '' චිත්‍ර වැඩමුළුව හා ප්‍රදර්ශනය**

ළමා ලේකම් කාර්යාලයේ ප්‍රතිපාදන මත නිර්මාණාත්මක කුසලතා වැඩි දියුණු කිරිම

**5. ''පෝෂණ මං පෙත '' වැඩසටහන**

මුල් ළමා විය දරුවන්ගේ පෝෂණය ඉහල නැංවිම සඳහා වැඩමුළු සංවිධානය කිරිම.

**<u>දිවි නැඟුම සංවර්ධන නිලධාරි - (දිවි නැගුම සංවර්ධන දෙපාර්තමේන්තුවට අනුයුක්තව)</u>**

**<u>කේ.පි.ජේ.ප්‍රියදර්ශිකා මහත්මිය/ එම්.එම්.එල්.ආර්.කුමාර මහතා</u>**

**1.'' සිප් දොර'' ශිෂ්‍යත්ව( පාසල් උපකරණ) වැඩසටහන**

- අඩු ආදයම්ලාභි දරුවන් සඳහා ලබා දෙයි. ඉල්ලීම් ලිපියක් දිවි නැඟුම සංවර්ධන නිලධාරි වෙත ඉදිරිපත් කර නිර්දේශය ලබා ගත යුතුය.

**2.දැනුවත් කිරිමේ වැඩසටහන් පැවැත්විම**

- ළමා අපයෝජනය හා ආරක්ෂාව ,ළමා අයිතිවාසිකම් සම්බන්දයෙන් දරුවන් හා දරුවන්ගේ දෙමව්පියන් දැනුවත් කිරිමේ වැඩසටහන් පැවැත්විම

**<u>උපදේශන නිලධාරි - (කාන්තා කාර්යාංශයට අනුයුක්තව)</u>**

**<u>ඩි.වි.එම්.එස්. විජෙසුන්දර මහත්මිය හා</u>**

**<u>උපදේශන නිලධාරි - (සමාජ සවිබල ගැන්විම් හා ශුභ සාධනඅමාත්‍යාංශයට අනුයුක්තව)</u>**

**<u>පි.ඩි.සිසිර කුමාර මහතා</u>**

**1.ළමා මානසික ගැටළු හඳුනාගැනිම හා මනෝ උපදේශනය සැලසිම**

- **දරුවන් සඳහා මනෝ උපදේශනය සලසා දෙමින් අත්‍යාවශ්‍ය අය සඳහා වෛද්‍ය ප්‍රතිකාර වෙතයොමු කිරිම.**

**2.ළමා පෞර්ෂ සංවර්ධන වැඩසටහන් ක්‍රියාක්මක කිරිම.**

**3.පාසල් වල ඉගෙනුම් දූර්වලතා ඇති දරුවන් සඳහා උපදේශනාත්මක වැඩමුළු පැවැත්විම.**

**4.ප්‍රජාව දැනුවත් කිරිමේ වැඩසටහන් ක්‍රියාක්මක කිරිම.**